## ශ්‍රී ලංකා හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරිය (ශ්‍රී ලංකා හදබිම අධිකාරිය) - 2013

ශ්‍රී ලංකා හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරියේ (ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ) 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1978 අංක 11 දරන කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබද ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 ශ්‍රී ලංකා හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරියේ (ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ) මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබද අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ආයතනය සතු වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී සමාන පන්තියක ඇති මුළු වත්කම් පංතියම එකවර ප්‍රත්‍යාගනනය කර අදාල ගැලපීම් ගිණුම්ගත කරනවා වෙනුවට වාහන පංතියෙන් තෝරාගත් වාහන කිහිපයක් පමණක් අවස්ථා 02 කදී ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

ගොවිහාරකාර අරමුදලට ගෙවිය යුතු ණය ශේෂය හා බැංකු/මුදල් ශේෂය රු. 334,400 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

#### 2.2.3 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබූ ජීව තොගයේ වටිනාකම හා භෞතික තොග සත්‍යක්ෂණ වාර්තාව අතර රු.155,235 ක වෙනසක් නිරීක්ෂණය විය.

#### 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) සේවකයින් 08 දෙනෙකුට ආපදා ණය අත්තිකාරම් වශයෙන් ගෙවා තිබූ රු.119,361 ක ශේෂයක් 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අය නොවී පැවතුණි.

(ආ) වර්ෂ 04 කට අධික කාලයක සිට අය නොවී පවතින රු.2,147,782 ක ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 ඡේදය හා මුදල් රෙගුලාසි 381 | විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය සහ මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව බැංකු ගිණුම් විවෘත කළයුතු වුවත් එයට අනුකූල නොවන පරිදි අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.24,263,555 ක් වටිනාකමින් යුතු බැංකු ගිණුම් 33 ක් ආරම්භකර තිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ | චක්‍රලේඛය ප්‍රකාරව අධිකාරිය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු. 23,704,832 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.32,554,452 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.56,259,284 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

අධිකාරියේ ප්‍රධාන කාර්යාලයට යාබදව පවත්වාගෙන යනු ලබන අලෙවිසැලෙහි 2012 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු.3,851,123 කින් හෙවත් සියයට 48 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) 2013 වර්ෂයේදී සැල්මොනෙල්ලා නම් රෝගය පැතිරීම නිසා කුකුළන් අධික ලෙස මියයාම හේතුවෙන් කුකුළු ගොවිපලෙහි සියලු සතුන් ඉවත්කර විෂාණුහරණය කර අලුතෙන් ආරම්භ කළයුතු බව පශු වෛද්‍යවරයා නිර්දේශ කර තිබුණි. නමුත් 2014 මැයි 22 දින වන විටත් පැරණි කුකුළු වර්ග 06කට අයත් කුකුළන් 138 දෙනෙකු සහ කුකුළු පැටවුන් 6300 ක් මිලදී ගෙන පැරණි ගොවිපලෙහිම රඳවා තිබුණි.

(ආ) 1991 නොවැම්බර් 07 දිනැති අංක 687/15 දරන ගැසට් නිවේදනය මගින් කෘෂිකාර්මික විවිධාංගීකරණ සහ ජනාවාස ජාතික අධිකාරිය, ශ්‍රී ලංකා හරිත දනව් බිම් සංවර්ධන අධිකාරිය ලෙස වෙනස් කරන ලදී. විෂය පථයේ වූ වෙනස්වීම්වලට අනුව පිළියෙල කරන ලද නව කාර්ය පටිපාටි සංග්‍රහය 2014 ඔක්තෝබර් 31 දින වන විටත් කෙටුම්පත් අවස්ථාවේ පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සිදු කර තිබූ නමුත්, සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබූ නිර්දේශයන් කිසිවක් 2014 ඔක්තෝබර් 31දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) 2012 වර්ෂයේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත රණවිරු සහභාගිත්වයෙන් ඉඩම් සංවර්ධන හා බෝග ඵලදායිතා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ප්‍රධාන ක්‍රියාකාරකම් 05 ක් යටතේ උප ක්‍රියාකාරකම් 6 කට රු.මිලියන 11.83 ක ඇස්තමේන්තුවක් අනුමත කර තිබුණි. එම ව්‍යාපෘතියෙහි ප්‍රධාන ක්‍රියාකාරකමක් වූ ජල පහසුකම් සංවර්ධනය සම්පූර්ණයෙන්ම අත්හැර තිබුණු අතර, කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ විධිවිධානවලට අනුකූල නොවන පරිදි
රු. මිලියන 1.9ක් වියදම් කර තිබුණි.

(ආ) ආනයනික මිරිස් ප්‍රමාණය අවම කර ගැනීමේ ජාතික වැඩසටහනට සක්‍රීය ලෙස දායකත්වය ලබා දීමේ අරමුණින් මූලික ක්‍රියාකාරකම් 3 ක් යටතේ 2013 වර්ෂයේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත අක්කර 1000 ක මිරිස් වගා ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණි. මෙහි ජල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් රු.2,400,000 ක් හා කාබනික පොහොර සැපයීම

වෙනුවෙන් රු.2,160,000 ක් වූ ප්‍රධාන ක්‍රියාකාරකම් 02 මුළුමණින්ම අතහැර, රු.1,182,239 ක් වැය කර දේශීය බීජ ලබා දීම යන ක්‍රියාකාරකම පමණක් ක්‍රියාත්මක කිරීම තුළින් අපේක්ෂිත අරමුණු කරා ළඟාවී නොතිබුණි.

(ඈ) අලෙවි කිරීමේ අරමුණුනින් පවත්වාගෙන යනු ලබන පැල තවාන්හි රෝපිත පැල මාස 03, මාස 06 ආදී වශයෙන් නියමිත කාලපරිච්ඡේදය තුළ වගකිව යුතු නිලධාරියෙකුගේ අධීක්ෂණය මත පැල සහතික කිරීමේ සේවාවක් පවත්වාගෙන ගොස් නොතිබුණි. මේ හේතුවෙන් රෝපිත පැළ කොපමණ ප්‍රමාණයක් අලෙවි වූයේද යන්න පැහැදිලි නොවීය.

## 4.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

(අ) පල්ලේකැලේ ගොවිපලෙහි ගබඩාවේ රු.712,970 ක් වටිනා යල්පැනගිය රසායනික පොහොර හා කෘෂි උපකරණ තොගයක් සහ මිල කර නොමැති ට්‍රැක්ටර් 3 ක් හා ටේලර් 3 ක් නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ) කොත්මලේ ගොවිපල භූමියෙහි ස්ථාපිත කර ඇති තාරා ඒකකය, හරිතාගාර 02ක, එළු ඒකකය, ගව ඒකකය සහ අත්ට්‍රැක්ටරයට අයත් නඟුල 2014 මැයි 30 දින වන විටත් නිෂ්ක්‍රියව පැවතුණි.

## 4.5 හඳුනාගන්නා ලද අලාභ

2013 වර්ෂයේ පල්ලේකැලේ කුකුළු ගොවිපොලෙහි මවු සතුන්ගේ සහ වැඩුණු සතුන්ගේ මියයාමේ වැඩි ප්‍රවනතාවයක් දක්නට ලැබුණි. ඒ අනුව රු.148,500 ක් වටිනා මවු සතුන් 104 ක් සහ සහ වැඩුණු සතුන් 94 ක් මිය ගොස් තිබුණ ද ඒ සඳහා පශු වෛද්‍ය වාර්තා ලබා ගෙන නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන්ව දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ගිණුම් ඉදිරිපත් කළයුතු බව දක්වා තිබුණද, දින 275 ක ප්‍රමාදයකින් පසුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි.

## 5.2 අභ්‍යන්තර විගණනය

අධිකාරියේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර ක්‍රියාත්මක කර තිබුණද එම ඒකකය ස්ථිර කාර්ය මණ්ඩලයකින් සමන්විත නොවීය.

## 5.3 විගණන කමිටු

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව අධිකාරිය විසින් වර්ෂයකට අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04 ක් වත් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුල පවත්වා තිබුනේ රැස්වීම් වාර තුනක් පමණි.

## 5.4 තවදුරටත් නොවිසඳී ඇති විගණන ඡේද

අධිකාරියට අයත් ලැබිය යුතු ගිණුමෙහි ඉදිරිපත් කර තිබුණු ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමෙන් අයවිය යුතු රු.2,094,280 ක මුදල පිළිබඳව 2010 හා 2012 වර්ෂවල පැවති පොදු ව්‍යාපාර පිළිබඳව කාරක

සභාවේ අවධානය යොමු කර විසඳීමට නියමකර තිබුණද, විගණන දිනය වූ 2014 නොවැම්බර් 28 දින වන විටත් නොවිසඳී පැවතුණි.

**6. පද්ධති හා පාලන**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින් වර අධිකාරියේ සභාපතිවරයා වෙත මාගේ වාර්තා මගින් පෙන්වා දී ඇත. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගැනීම
(ආ) අලෙවිසැල් පරිපාලනය හා මූල්‍ය කළමනාකරණය
(ඇ) භාණ්ඩ සමීක්ෂණය
(ඈ) ගොවිපලවල කළමනාකරණය